**සී/ස මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම - 2023**

**--------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 11 හි 27 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම්වල හානිකරණයක් සිදුව ඇත්නම් ඒ සඳහා හානිකරණ අලාභ හඳුනා ගැනීම සිදුකළ යුතු වුවද, රු.33,086,687 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් රු.6,902,509 ක වසර 05 ඉක්මවූ හා වර්ෂ 05 ට අඩු රු.26,184,130 ක ශේෂ සඳහා හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි. එම ශේෂයන් සඳහා ශේෂ සනාථන හෝ අනෙකුත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | ලැබිය යුතු ශේෂය අයකරගැනීම සඳහා මේ වන විටත් අදාල ආයතන සමග කටයුතු කරගෙන යන අතර අයකර ගත නොහැකි ශේෂ නිශ්චිතව හදුනාගෙන ඉදිරියේදී විගණනය විසින් පෙන්වා ඇති ආකාරයට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව බොල් ණය ඇතිවීමේ හැකියාව තක්සේරු කර හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කළයුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 29 හි 7 ඡේදය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ගිණුම් ප්‍රතිපත්ති අංක 3.3.2.4.1 අනුව බදු වියදම ගණනය කිරීමේදී විලම්භිත බදු සැලකිල්ලට නොගෙන ප්‍රමිතියේ 29 හි 2 ඡේදය අනුව වර්ෂයේ ආදායම් බදු වියදම ගණනය කර ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විලම්භිත බදු සැලකිල්ලට ගෙන ආදායම් බදු ගණනය කර ගිණුම්ගත කළයුතුය. |
| (ඇ) | මොරගහකන්ද සංචාරක බංගලාව ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ගෙවීම් සිදුකිරීම නිසා වැඩිපුර ගෙවූ රු.20,200,000 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු මුදලක් ලෙස වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 21 ඡේදය අනුව සෑම වාර්තා කරන කාලසීමාවක් අවසානයේම මූල්‍ය වත්කම්වල හානිකරණය හඳුනාගත යුතු වුවත්, ලැබීම අවිනිශ්චිත රු.20,200,000 ක උක්ත ශේෂය වෙනුවෙන් හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි. | මෙම මුදල අයකරගැනීම සඳහා නීතිපති විමසා ඇති නිසා නිශ්චිතව හදුනාගැනීමට නොහැකිවීම මත අඩමාන ණය වෙන්කිරීම සිදුකර නොමැත. ඉදිරියේදී අඩමාන ණය වෙන්කිරීම සිදුකරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හානිකරණ අලාභ සඳහා වෙන් කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 29 හි 38 ඡේදය හා 39 ඡේදය අනුව වර්ෂය සඳහා වූ ආදායම් බදු ගණනය කිරීම හා අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස දැක්විය යුතු වුවත්, සමාගම එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් බදු ගණනය කර අවශ්‍ය හෙළිදරව් කිරීම් කළයුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.1 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරන බවත්, ඒ අනුව එම ප්‍රමිති මඟින් අනාවරණය වන සෑම අවස්ථාවකදීම එම ප්‍රමිති භාවිතා කළයුතු වුවද,සටහන් අංක 3.3.1 හි ආදායම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 අනුවද ,සටහන් අංක 3.2.2 හි පාරිතෝෂික වෙන් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුවද, සටහන් අංක 3.3 හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අනුව සිදුකරන බවද දක්වා තිබුණි. | සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ මූලික පදනම කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිය අනුගමනය කරන අතර එක් එක් නිශ්චිත අවස්ථාවලදී පොදුවේ හඳුනාගත් ප්‍රමිති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් හඳුන්වාදී ඇති ආදායම් හඳුනා ගැනීම හා සටහන් කිරීම ප්‍රමිති අංක15 අනුවද පාරිතෝෂික වෙන්කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුවද සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව ඒකාකාරීව පිළියෙල කළයුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 3.3.2.1 අනුව මූල්‍ය නොවන වත්කම් හානිකරණය, සෙමින් චලනය වන තොග සහ අධි වර්ධිත පැල තවාන් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් සිදුකරන බවට දක්වා තිබුණද, ඒ සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 3.3.2.1 විගණන සමීක්ෂණයට අනුව තොග නොමැති බැවින් ඊට අනුරූපිව ඉදිරි වර්ෂයේ දී සටහන සංශෝධනය කිරීමට අපේක්ෂා කෙරේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ සටහන් පමණක් ඇතුළත් කළයුතුය. |
| (ඇ) | යෝජිත ගිං නිල්වලා ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තාවේ අවසන් වාර්තාව පිළියෙල කිරීම වෙනුවෙන් වූ ආදායම ලෙස රු.9,713,554 ක් දෙවරක් ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධි තක්සේරු වී තිබුණි. මේ හේතුවෙන් ලැබිය යුතු ආදායම් රු.7,770,843 කින් අධි ගණනයවී තිබූ අතර, වැඩපූර්ව අත්තිකාරම් රු.1,942,710 ක් වැඩිපුර අය කිරීම නිසා අඩුවෙන් දක්වා තිබුණි. | යෝජිත ගිං නිල්වලා ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තා සැකසීම වෙනුවෙන් අවසන් වාර්තා පිළියෙල කිරීම සඳහා 2023/01/05 වන දින ඉදිරිපත් නරන ලද ඉන්වොයිස් පතේ වටිනාකම රු.9,713,554 ක් වන අතර, 2023/12/23 වන දින මුදල් ලබාගැනීමට ඉදිරිපත් කරන ලද ඉන්වොයිස් පතේ වටිනාකම රු.9,713,554 ක් වේ. | ගනුදෙනුව දෙවරක් සටහන් නොවීමට පවත්නා ගිණුම් ක්‍රමය නිවැරදි කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් අයවියයුතු ශේෂයක් ලෙස රු.1,319,471 ක් දක්වා තිබුණද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සමාගමට ගෙවිය යුතු ශේෂ කිසිවක් දක්වා නොතිබුණි. එම වෙනස්කම් පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි යවා ඇති අතර ඒ වෙනුවෙන් නොගෙවිය යුතු ශේෂයක් වශයෙන් අපහට දැනුම් දී නොමැත. | අදාළ ශේෂ සනාථන ලබාගෙන වෙනස්කම් සොයා බලා නිරවුල් කල යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අත්තිකාරම් | 3,949,434 | අදාළ පියවීම් වවුචර් | නිරීක්ෂණය කර ඇති ගෙවීම් අත්තිකාරම් සහ ඊට අදාල පියවීම් සමාගම සතුව විගණන නිරීක්ෂණය සඳහා පවතී. | විගණන පරීක්ෂාවට හැකිවන පරිදි ඒවා නඩත්තු කිරීම, පවත්වාගෙන යාම හා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම කල යුතුය. |
| (ආ) | විලම්භිත බදු වගකීම | 611,866 | ශේෂ සනාථන ලිපි | මේ සම්බන්ධයෙන් ආදායම් බදු දෙපාර්තුමේන්තුව සමග කටයුතු කර සුදුසු තිරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද කාර්ය පටිපාටික රීතිවල IX පරිච්ඡේදයේ 115 වගන්තිය | කිසියම් තනතුරක වැඩබැලීම සඳහා පත් කළහැක්කේ එම තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි හෝ සඳහන් සියළු සුදුසුකම් සපුරා ඇති එම තනතුරට සමාන තනතුරක හෝ එම තනතුරට ආසන්න පහළ තනතුරක හෝ සේවයේ යෙදී සිටින ස්ථිර නිලධාරියෙකු වුවද, පරිවාස කාලසීමාවේදී මාණ්ඩලික නොවන MN-04 වැටුප් පරිමාණයේ නිත්‍ය තනතුරක සිටින නිළධාරිනියක් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී කාණ්ඩයේ HM 1-3 පරිමාණයේ තනතුරක | නිරීක්ෂණය හා එකඟ නොවේ.<br><br>වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනිමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර, ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ. | කාර්යය පටිපාටි රීතිවලට අනුකූලව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වැඩබැලීම සඳහා පත්කර තිබුණි.මෙම නිලධාරිනිය උක්ත තනතුරේ වැටුප් ලබන අතරම 2021 පෙබරවාරි සිට 2023 දෙසැම්බර් දක්වා රු.60,907 බැගින් එකතුව රු.2,131,745 ක්වූ වැඩබැලීමේ දීමනාවක් ලබා ගෙන තිබුණි. | | |
| (ආ) | 2006 ඔක්තෝබර් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 02 වන පරිච්ඡේදය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන කේත ඇතුළු අවශ්‍ය මගපෙන්වීම් ඉදිරි මාස කිහිපය තුළ සකස් කර ඊට අනුකූලව අදාළ ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු පත් කිරීමට බලාපොරොත්තු වේ . | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කළයුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති රජයට අයත් ආයතනවල සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | 2.2.2(අ) වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් අවම වශයෙන් මසකට වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩලය රැස් කිරීමට කටයුතු කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 5 ක් පමණක් පවත්වා තිබුණි. | ඉදිරියේදී පවත්වන රැස්වීම් වාර ගණන වැඩි කිරීමට අපේක්ෂිතය. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ii) | 05 වන පරිච්ඡේදය | කෙටිකාලීන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිශ්චිත පියවර සහ කාර්යයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සහ සමාගමේ දිගුකාලීන දැක්ම සහ සමස්ත දිශානතිය නිර්වචනය කරන පරිදි පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | දැනට සංක්ෂිප්ත ක්‍රියාකාරී සැලැස්මක් අනුව කටයුතු කෙරේ. එය කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය සමයේ සකස් කර පැවති අතර විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් දැක්ම හා දිශානතියද අදාළ කරගනිමින් ඉදිරි මාස කිහිපය තුළ සකස් කිරීමට අපේක්ෂිතය . | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී හා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 4.2 වගන්තිය | විගණන කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි මාස කිහිපය ඇතුළත ස්ථාපිත කෙරෙනු ඇත . | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන කමිටු ස්ථාපිත කළයුතුය. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත | | | |
| (i) 3.2 වගන්තිය | සියළුම රාජ්‍ය ව්‍යාපාර කාර්ය මණ්ඩලය, බඳවා ගැනීමේ පරිපාටිය හා වැටුප් ගෙවීම් ව්‍යුහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළව ඔවුන්ගේ ඉල්ලීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ අදාළ වන පරිදි රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් (DGPED) හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් මගින් (DGNBD) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යැවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ.<br>2025 මැයි මාසයට පෙර අදාළ අනුමැතීන් ලබා ගැනීම සඳහා සමාගම කටයුතු කරමින් පවතී. | සියළුම කාර්ය මණ්ඩල බඳවා ගැනීම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සිදුකළ යුතුය. |
| (ii) 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන්වී මාස 05 ක් තුළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාගමේ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව සොයා බලා නිසි කටයුතු කරනු ලැබේ. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතුය. |
| (iii) 6.7 වගන්තිය | සමාගමේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | මේ පිළිබඳව සොයාබලා සුදුසු පියවර ගනු ලැබේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළයුතුය. |
| (iv) 7.2 වගන්තිය | සමාගමේ කාර්යසාධනය ඇගයීම පිණිස මූලික කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක පිහිටුවා ඒ සඳහා | ඉදිරියේ දී මේ සම්බන්ධව සොයා බලා නිසි පරිදි කටයුතු කරනු ලැබේ. | කාර්යසාධනය ඇගයීම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු වුවද එසේ කර නොතිබුණි. | | ප්‍රකාරව සිදු කළයුතුය. |
| (v) 7.5 වගන්තිය | සමාගමේ මාසික, කාර්තුමය හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත්, එසේ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සියලුම කාර්යසාධන වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සිදු කළයුතුය. |
| (vi) 7.6 වගන්තිය | සමාගමේ කාර්යසාධනයට අදාළ තොරතුරු රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට වාර්තා කිරීම සඳහා නිලධාරියෙකු පත් කළයුතු වුවත්, එසේ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සිදු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,064,123 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.6,430,564 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,633,559 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සේවා පිරිවැය රු.2,399,096 කින් වැඩිවී තිබුණද, උපදේශන සේවා ආදායම රු.7,453,185 කින් වැඩිවීම මෙහෙයුම් ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 13(18) වගන්තිය ප්‍රකාරව අනුබද්ධිත සමාගමක් ලෙස පිහිටුවන ලද මෙම සමාගමේ පවතින සියළු මූල්‍ය හා නෛතික වත්කම්, බැරකම් හා කාර්ය මණ්ඩලය මෙන්ම ගිවිසුම්ගතව ඇති උපදේශන සේවාවන් සහ සිදුකරන සියළු ක්‍රියාකාරකම්ද සමඟ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට පැවරීමට 2019 ඔක්තෝබර් 30 දිනැති අංක අමප/19/2770/104/083 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 30 දින රු.10 බැගින් කොටස් 6,385 ක් වූ රු.63,850 ක කොටස් ප්‍රාග්ධනය වාරිමාර්ග අමාත්‍යාංශයට පවරා තිබුණි. එසේ වුවද අයිතිය පැවරීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොකර සමාගම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලිත සමාගමක් බවත් ඉක්මනින් වාරිමාර්ග | පිළිතුරු ලබා දී නොමැත. | අයිතිය පැවරීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශන වලට සටහන් නිවැරදිව ඉදිරිපත් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය යටතට පත් කිරීමට කටයුතු කරන බවත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්ති හා සටහන් අංක 3.2.3 හි දක්වා තිබුණි. | | |
| (ආ) | සමාගම ප්‍රධාන වශයෙන් වාරිමාර්ග අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති මඟින් පවරන කාර්යයන් පමණක් ඉටුකර තිබූ අතර, අනෙකුත් උපදේශන සේවා සපයන පෞද්ගලික ආයතන සමග තරඟකාරී ලෙස මිල ගණන් ඉදිරිපත් කරමින් පෞද්ගලික අංශයේ උපදේශනාත්මක කාර්යයන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේ දී වාර්තා කරනු ලැබේ. | තරඟකාරී ලෙස පෞද්ගලික අංශයේ උපදේශනාත්මක කාර්යයන් ලබාගැනීම සිදුකළ යුතුය. |
| (ඇ) | ආදායම් ජනනය කරන ඒකක සඳහා වෙනම ආදායම් හා වියදම් හඳුනාගෙන ලාභ පාඩු ගැලපීම සිදුකල යුතු වුවත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලෝක උරුම නකල්ස් ජලපෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංභාද්‍රෝණි සහ පහළ නිම්නවල වෙසෙන ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ව්‍යාපෘති ලියවිලි (Project Documents) මඟින් තීරණය කර ඊට අදාළ කටයුතු සඳහා දරන වියදමින් ප්‍රතිශතයක් ආදායම ලෙස ලබාගෙන තිබුණි. මීට අදාළව ආදායම් වියදම් හඳුනා ගැනීම සඳහා වෙනම ගිණුම් තැබීමක් සිදුකර ලාභ පාඩු ගලපා නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේ දී වාර්තා කරනු ලැබේ | ඒ ඒ උපදේශන කාර්යයන්ට අදාළව වෙන වෙනම ආදායම් වියදම් හඳුනාගෙන ගිණුම් තැබීම කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් පිළියෙල කිරීම සඳහා 2017 අප්‍රේල් 28 දින වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුමේ කොන්ත්‍රාත් වටිනාකම රු.22,138,000 ක් ලෙස එකඟවී එම ගිවිසුම අනුව අදාළ කාර්යයන් මාස 09 ක් තුළ නිම කළයුතු වුවත් නියමිත දිනට කාර්ය ඉටු කර නොතිබියදි 2022 පෙබරවාරි 09 දින කොන්ත්‍රාත්තු වටිනාකම රු.38,854,215 ක් ලෙස වැඩි කර තිබුණි. සමාගම 2022 දෙසැම්බර් 13 දින කෙටුම්පත් අවසන් වාර්තාව මේ සඳහා පත් වූ තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ අතර, තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව 2023 දෙසැම්බර් 27 දින සමාගම වෙත ලබාදී | ගිං නිල්වලා ව්‍යාපෘතියේ පරිසර අධ්‍යාන වාර්තාව සැකසීම සඳහා අප කාර්යාංශය ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු විවිධ ගැටළුකාරී වාතාවරණය සහ එම ව්‍යාපෘතිය නිසා රටේ ඇතිව තිබූ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මෙම සේවාවේ කටයුතු තාවකාලිකව නතර කරන ලදි. 2021 දී නව කළමණාකාරිත්වයක් යටතේ නැවත ආරම්භ කලද පවතින සංකීර්ණතාවය හා 2017 දී මෙම EIA වාර්තාව සැකසීම සඳහා බඳවාගෙන සිටි උපදේශකවරුන් පිරිසක් ඉල්ලා අස්වීම නිසා අලුතින් කණ්ඩායම් සාමාජිකයින් බඳවා ගැනීමට සිදුවිය.ඒ සඳහා නව වියදම් ඇස්තමේන්තුවක් සඳහා අනුමැතිය හිමිවිය.ඉන් | ගිවිසුම් ප්‍රකාරව භාරගත් උපදේශන කාර්යය නියමිත දිනට නිම කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එම වාර්තාව මඟින් අදාළ කෙටුම්පත් වාර්තාවේ පොදු අඩුපාඩු ලෙස අඩුපාඩු 07 ක් ද, විධායක සාරාංශ යටතේ අඩුපාඩු 09 ක් ද, පරිච්ඡේද 07 ක් යටතේ අඩුපාඩු 95 ක් ද නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස දක්වා තිබූ නමුත්, 2024 ජූලි 22 දින තෙක් එම අඩුපාඩු නිවැරදි කර වාර්තාව නිකුත් කර නොතිබුණි. | අනතුරුව ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු ගාල්ල, මාතර, හම්බන්තොට යන නගර තුල සිදු කරන ලද්දේ කොවිඩ් වසංගතය,ඉන්ධන අර්බුදය වැනි දුෂ්කරතා හේතුවෙන් සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය. ඉන් පසුව අවසන් වාර්තාව සේවා යෝජකයාට ලබා දී ඇත. මෙම අවසන් වාර්තාව සැකසීමේදී තාක්ෂණ ඇගයීම් කමිටුව විසින්, අවසන් කෙටුම්පත් වාර්තාව සඳහා ලබාදුන් සියලු අඩුපාඩු සැලකිල්ලට ගනිමින් වාර්තාවේ පැවති සියලු වැරදි නිවැරදි කෙරිණි. | |
| (ආ) | වියළි කලාපීය ගොවීන් සඳහා කාලගුණ උපදේශන පද්ධති ස්ථාපිත කිරීමට සහායවීම හා ඩිජිටල් පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන උපදේශනාත්මක සේවා ව්‍යාපෘතියක් රු.75,859,875 ක මුදලකට සැපයීම සඳහා සමාගම හා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2022 නොවැම්බර් 01 දින ගිවිසුම්ගතව තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ කාර්යය මාස 08 ක් තුළ එනම් 2023 ජූනි වන විට නිම කළයුතු වුවත්, විගණිත දින වන 2024 ජූලි 22 දක්වා නිමකර නොතිබුණි. තවද, මෙම උපදේශනාත්මක කාර්යය සඳහා 2024 ජනවාරි 31 න් පසුව දින දීර්ඝ කිරීම් ලබාදී නොතිබුණි. විෂය නීර්ණය පත්‍රිකාව අනුව ඉටු කළයුතු ප්‍රධාන කාර්යයන් 5 ක් අතුරින් 2 ක් පමණක් විගණිත දින වනවිට ඉටුකර තිබුණි. | මෙම උපදේශක සේවාවේ තුන් වන වාර්තාව ලබා දී ඇති අතර, මීට අදාල ඩිජිටල් පද්ධතිය සැකසීම මේ වන විට අවසන් අදියරේ පවතී. මෙම ඩිජිටල් පද්ධතිය, මෙවර පැවැත්වීමට නියමිත මහ කන්නය සඳහා කෘෂිකාර්මික උපදේශන සම සංවර්ධන දිස්ත්‍රික් වැඩමුළු හරහා ගොවින්ට හඳුන්වා දීමට සූදානම් වී සිටින අතර එය අනුරාධපුර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මන්නාරම, සහ වව්නියාව යන දිස්ත්‍රික්ක වලදී සිදුකිරීමට කටයුතු යොදා ඇත. මේ සඳහා අදාල දින දීර්ඝ කිරීම නියමිත පරිදි ලබාගෙන ඇත. | ගිවිසුම් ප්‍රකාරව භාරගත් උපදේශන කාර්යය නියමිත දිනට නිම කළයුතුය. |
| (ඇ) | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියට භූගෝලීය දත්ත සමුදාය හා ජංගම යෙදුම් සකස් කිරීමට අදාළ සේවා සපයන්නෙකු ලෙස උපදේශනාත්මක සේවාවක් සැපයීම සඳහා එම ව්‍යාපෘතිය හා සමාගම 2023 ජූනි 30 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙහි කොන්ත්‍රාත් වටිනාකම රු.3,742,460 ක් වී තිබුණු අතර, ගිවිසුම අනුව අදාළ කාර්යයන් මාස 04 ක් තුළ නිම කළයුතු බව දක්වා තිබුණද, විගණිත දින වන 2024 ජූලි 22 දින දක්වා එම කටයුතු අවසන්වී නොතිබුණි. මෙම උපදේශනාත්මක කාර්යය සමාගම විසින් මුළුමනින්ම උප කොන්ත්‍රාත්තුවක් ලෙස බාහිර ආයතනයකට පවරා දී තිබූ අතර, ඔවුන් විසින් ලබා දියයුතු වාර්තා හතරක් අතුරින් විගණිත දින වූ 2024 | මෙම උපදේශක සේවාව වෙනුවෙන් අදාල සියලු කාර්යන් නිමකොට සේවා යෝජකයා වෙත ලබා දී ඇති අතර ඒ සඳහා අදාල අවසන් ගෙවීමෙන් සියයට 25ක ප්‍රමාණයක් හැරුණු කොට සියලු මුදල් අප ආයතනය වෙත ලැබී ඇති අතර, මෙම "දත්ත සමුදාය සහ ජංගම යෙදුම" භාවිතය තුලදී යම් ගැටළු මතුවුවහොත් තාක්ෂණික සහය ලබා ගැනිමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා ඉහත සඳහන් මුදල, අවසන් බෙදාහැරීම ලබාදුන් දින වන 2024.04.25 ට අවුරුද්දක් ගතවන තුරු රඳවා තබා ගනු ඇත. | ගිවිසුම් ප්‍රකාරව භාරගත් උපදේශන කාර්යය නියමිත දිනට නිම කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජූලි 22 වන විට ලබාදී තිබුණේ එක් වාර්තාවක් පමණක් වන අතර, ඒ අනුව ගිවිසුම්ගත මුදලින් රු.748,492 ක් පමණක් සමාගමට ලැබී තිබුණි. | | |
| (ඇ) | කාර්ය මණ්ඩලය තුළට ස්ථිරව සේවය කරන උපදේශකයින් බඳවා නොගෙන අමාත්‍යාංශය විසින් පිරිනමන ලද උපදේශනාත්මක ව්‍යාපෘති හා කොන්ත්‍රාත්තු බාහිර උපදේශකයින් වෙත ලබාදීමෙන් ඉටුකරවා ගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට සමාගම වෙත අමාත්‍යාංශය හා ව්‍යාපෘති වෙනුවෙන් රු.127,905,675 ක් වටිනා උපදේශනාත්මක කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබූ අතර, එම උපදේශනාත්මක කොන්ත්‍රාත් ඉටුකිරීම සඳහා සමාගම බාහිර උපදේශකයින් 34 දෙනෙකු හා එක් බාහිර පුද්ගලික සමාගමක් සමඟ රු.31,317,322 වටිනාකමට ගිවිසුම් ගතවී තිබුණි. ඒ අනුව සමාගම රු.96,588,333 ක එනම් සියයට 300 ක පමණ දළ ලාභයක් උපයාගෙන තිබුණි. මෙම කොන්ත්‍රාත් 5 අතුරින් රු.79,608,335 ක් වටිනා කොන්ත්‍රාත් 2 ක් ම සමාගමට පිරිනමා තිබුණේ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කරන විදේශ ආධාර ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේ දී වාර්තා කරනු ලැබේ. | පෞද්ගලික ආයතන සමඟ තරඟකාරී මිල ගණන් මත උපදේශන කොන්ත්‍රාත් ලබා ගැනීමට හා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත් කටයුතු කල යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම 2017 වර්ෂයේදී මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබාදී තිබූ අතර, ඊට අදාළ අතුරු ගෙවීම් සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට රු.20,200,000 ක පාඩුවක් සිදුව තිබුණි.2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා මාසයක් තුළ කාරක සභාවට වාර්තා කළයුතු බව නිර්දේශ කර තිබුණද, එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු අතර, විගණිත දිනය වූ 2024 ජූලි 22 දක්වා අදාළ පාඩුව අයකර ගැනීම සඳහා වන නෛතික ක්‍රියාමාර්ග ආරම්භ කරද නොතිබුණි. | ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පාඩුව අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවමය 2 ක් හා උපරිමය 7 ක් වන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් නිශ්චිත විධිවිධාන සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වා නොතිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II පංතියේ II ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරුවරයකු වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරට පත්කර තිබුණි. එම නිලධාරීයා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර තිබුණි. එම ප්‍රධාන විධායක නිලධාරියා වෙත නිකුත් කර තිබූ පත්වීම් ලිපිය අනුව නිලධාරියාගේ පත්වීම පූර්ණකාලීනද අර්ධකාලීනද යන්න පැහැදිලිව දක්වා නොතිබුණු අතර, ඔහුගේ දීමනාව ලෙස 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරකට හිමි රු.98,215 ක වැටුප හා වර්ෂ 05 කට අදාළ රු.13,500 ක වැටුප් වර්ධක ඇතුළත් වැටුපෙන් අඩක් හා අනෙකුත් දීමනාද ඇතුළත් වන පරිදි රු.52,342 ක් බැගින් භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි. මෙකී දීමනා ලෙස 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. 697,890 ක් ගෙවා තිබුණි. ඒ අනුව මොහුට 2023 වර්ෂය සඳහා තම තනතුරට අදාළව රු.926,976 ක් වැටුප් ලෙසද, ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා රු. 697,890 ක් දීමනා ලෙසද ලබාගෙන තිබුණි. | නිරීක්ෂණය හා එකඟ නොවේ.<br><br>වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනිමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ. යෙදවීම රජයේ අවශ්‍යතාවය අනුව ආයතන සංග්‍රහයේ 1.4 හා 1.6 වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ආයතන සංග්‍රහයේ 09 වන පරිච්ඡේදයේ 2.2 පරිදි පෞද්ගලික රාජ්‍ය ආයතනයකට සේවා සැපයීමේ පදනමින් මෙම සේවාව සමාගම මඟින් සලසා ගැනීම සඳහා රජයේ නිලධාරියෙකු යොදවා ගෙන ඇත. | සාංසමික සංස්ථාවලිය සංශෝධනයට හා පත් කිරීම් සඳහා නිසි අනුමැතිය ලබා ගැනීමටත්, පත්වීම්වලට අදාළ සියළු කොන්දේසි ඇතුළත් කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) වශයෙන් කටයුතු කළ නිලධාරිනිය සමාගම් ලේකම්/නීති නිලධාරී තනතුර සඳහා පත්කර තිබුණද, අදාළ නිලධාරිනිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් නිදහස් කර නොතිබුණු අතර, පත්වීම් ලිපියේ පත්වීම් ස්වභාවය, දීමනා ගෙවන ආකාරය හා අනෙකුත් පත්වීම් කොන්දේසි දක්වා නොතිබුණි. 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව උක්ත තනතුර සඳහා අදාළ වන රු.55,925 ක වැටුප හා රු.6,875 ක් වූ වර්ෂ 05 ක වැටුප් වර්ධක යන ඒවායේ එකතුවෙන් අඩක් හා අනෙකුත් දීමනා ඇතුළත් වන පරිදි රු.33,700 ක් බැගින් වූ දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මාසිකව ගෙවා | -එම- | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| තිබුණි. මෙකී දීමනා ලෙස 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 404,400 ක් ගෙවා තිබුණි. තවද මෙම නිලධාරිනිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා ගෙවනු ලබන දීමනාව ලෙස රු.30,000ක මුදලක්ද ලබා ගෙන තිබුණි. | | |
| (ඇ) වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් සමාගමේ ව්‍යාපෘති කළමනාකරු තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා අනුයුක්ත කර තිබුණු නිලධාරිනිය 2019 අගෝස්තු 01 දින සිට අභ්‍යාසලාභී උපාධිධාරියෙකු ලෙස වාරිමාර්ග අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර, 2021 ජනවාරි 01 දින සිට සංවර්ධන නිලධාරී තනතුරට පත් කර තිබුණි. පත් කිරීමේ බලය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සතු වුවද, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් තම විෂය පථය ඉක්මවා උක්ත පත් කිරීම් සිදුකර තිබුණි. තවද මෙම නිලධාරිනිය ඇයගේ නිත්‍ය තනතුරවන සංවර්ධන නිලධාරී තනතුර සඳහා වැටුප් ලෙස රු.572,160 ක් ද, සමාගමේ ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහා රු.730,890 ක දීමනාවක්ද 2023 වර්ෂය සඳහා ලබාගෙන තිබුණි. සමාගම විසින් දීමනාව ගණනය කිරීම සඳහා HM 1.3-2016 වැටුප් කේතය පදනම් කරගෙන තිබූ අතර, එයට වෙනත් දීමනා ලෙස රු.2,300 ක් ද පැමිණීමේ දීමනාව ලෙස රු.1,500 ක් ද, ගමන් වියදම් දීමනා ලෙස රු.8,000 ක් ද එකතු කර තිබුණි. | -එම- | පත් කිරීම් බලධරයාගේ අනුමැතිය ලබා ගැනීමටත්,බඳවා ගැනීම් පරිපාටිය හා ගෙවීම් ව්‍යූහ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |